12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka ISSN 2362-0412

# සිංහල නවකථාකරුවා සමාජ ස්තරායනය නිරූපණය කළ ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

*ඩී. එම්. ශ්‍රියානි*

*සිංහල අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය,රුහුණ විශ්වවිද්‍යාලය*

*sriyanidenipitya@gmail.com*

**සාරසංක්ෂේපය**

සිංහල සාහිත්‍යය විෂය පථයෙහි විවිධ සාහිත්‍ය ප්‍රවර්ගයන්ට අයත් සාහිත්‍ය නිර්මාණ දැකගත හැකිය. ඒ අතර නවකථාව නමැති සාහිත්‍යාංගය සුවිශේෂී වන්නේ පොදු පාඨක පිරිසක් ඒ වටා ඒකරාශි වීම නිසයි. නවකථාව හා මානව සමාජය අතර ඇත්තේ අවියෝජනීය සම්බන්ධයකි. නවකථාකරුවා මිනිස් ජීවිතයේ යථාතත්ත්වය මැනවින් ග්‍රහණය කරගනිමින් එය නිර්මාණශීලී ව නවකථාවෙන් නිරූපණය කරයි. එහෙයින් සිංහල නවකථාව සමාජයේ කැඩපතක්ලෙස සැලකිය හැකිය. නවකථාවෙන් සමාජයේ විවිධ පැතිකඩ විමර්ශනය කෙරෙයි. මෑතකාලීන සිංහල නවකථාව තුළ කුලය, පන්තිය, ස්ත්‍රී-පුරුෂභාවය, ශරීර වර්ණය, ජාතිය යනාදී සමාජ ස්තරායන මිනුම් නිරූපණය වී ඇති ආකාරය අධ්‍යයනය කිරීම පර්යේෂණයේ අරමුණයි. නවකථා හයක නියදිය ඔස්සේ සමාජ ස්තරායනය නිරූපණය වී ඇති ආකාරය විමසුමට ලක්විය. සාමාජ ස්තරායනය හේතුවෙන් පීඩාවට පත්වන මිනිස් ජීවිතය මෑතකාලීන නවකථාවෙන් මැනවින් නිරූපණය වී ඇති අයුරු දැකිය හැකිය. එහිදී කුලය, පන්තිය, ස්ත්‍රී-පුරුෂභාවය, ශරීර වර්ණය, ජාතිය යනාදියෙහි වර්තමානයේ පවතින තත්ත්වය කෙරෙහි වැඩි අවධානය යොමු විය. එම සමාජ තත්ත්වයන් මෑතකාලීන නවකථාවෙන් නිරූපණය වී ඇති අයුරු විමසුමට ලක්විය.

***ප්‍රමුඛ පද* - *සමාජ ස්තරායනය, සමාජ ස්තරායන මිනුම්, නවකථාව, ලාංකේය සමාජය,වර්තමාන තත්ත්වය***